සැප්තැම්බර් 21 සති අග අරුණ පුවත්පතේ "සති දෙකකට අපනයන ආදායම ඩොලර් මිලියන 500 පනියි" යන සිරස්තලයෙන් වූ පුවත් වාර්තාවකි. මෙහි එක් අනු සිරස්තලයක දැක්වී තිබුණේ 'යහපාලනයේ වැඩිම ආදායම මසකට ඩො. මිලියන 999යි' යනුවෙනි. මෙහි අන්තර්ගතයේ සඳහන්ව තිබුණේ පසුගිය ජූලි මාසයේදී ඩොලර් මිලියන 1060 ක අපනයන ආදායමක් ලැබී ඇති බවත්, 2019 යහපාලන ආණ්ඩුව සමයේදී ජූලි මස අපනයන ආදායම ඩොලර් මිලියන 999 ක් වී ඇති බවත් වේ.

මෙම කරුණු විමසා බැලීම සඳහා අපි ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය අංශයේ මාසික අපනයන දත්ත පරිශීලනය කළෙමු. එහි 2020 ජූලි මස අපනයන ආදායම ඩොලර් මිලියන 1086 ක් ලෙසින් දැක්වුණු අතර, 2019 ජූලි මස අපනයන ආදායම ඩොලර් මිලියන 998.5 ක් ලෙස දැක්වී ඇත. ඒ අනුව උක්ත පුවතේ අන්තර්ගතයේ අඩංගු කරුණු නිවැරදි යැයි පැවසිය හැක.

කෙසේ වෙතත් ගැටළුව වන්නේ අනු සිරස්තලය තුළ යහපාලන රජය සමයේ වැඩිම අපනයන ආදායම වී ඇත්තේ මසකට ඩොලර් මිලියන 999ක් යැයි සඳහන් වීමයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය අංශයේ මාසික අපනයන දත්ත මගින් දැක්වෙන්නේ 2015 න් පසු යහපාලන රජය සමයේ අපනයන ආදායම ඩොලර් මිලියන 999 ඉක්මවා ගොස් තිබෙනා මාස ගණනාවක් පවතින බවයි (උදා: 2015 මාර්තු, 2017 මාර්තු, ජූලි, අගෝස්තු, සැප්තැම්බර්, දෙසැම්බර්, 2018 මාර්තු, ජූනි, ජූලි, අගෝස්තු, සැප්තැම්බර්, දෙසැම්බර්, 2019 ජනවාරි, මාර්තු, ජූනි, අගෝස්තු).

මෙසේ බැලූ විට මෙහි අනු සිරස්තලය, පුවත් අන්තර්ගතයේ සඳහන් කරුණු වලට නොගැලපේ. එසේම නිල වෙළඳ දත්ත හා සසඳා බැලූ කළද එම අනු-සිරස්තලයෙන් දැක්වෙන කරුණ සාවද්‍ය වේ. මෙසේ නිරවද්‍ය නොවන හා නොමග යවන සුළු කරුණු පළ කිරීම මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය කිරීමක් වන බව අපි අවධාරණය කරමු.

මින් පෙරද සිරස්තල යෙදුම පිළිබඳව වන සංවාදයන් හිදී මතුවූ කරුණක් වූයේ, බොහෝ විට පුවත් වාර්තාවක් සඳහා සිරස්තල යොදනු ලබන්නේ පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොවන බවයි. ඒ බවද අවසානයට සඳහන් කරමු.

මූලාශ්‍ර:

ශ්‍රී ලංකා මහ බැංකුව, සංඛ්‍යාලේඛන විදේශීය, අපනයන -මාසික (2006 සිට නවතම දත්ත දක්වා), ප්‍රවේශය: https://www.cbsl.gov.lk/.../statistical.../external-sector (අවසන් වරට ප්‍රවේශය: 2020 සැප්තැම්බර් 21)

**#MediaEthicsSL #lka #SinhalaPress #SathiAgaAruna**
See Less